## ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2014

---

ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 356,546 ක් වටිනා නාම පුවරුවක් මිලදී ගෙන දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණද. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දේපල පිරියත උපකරණවලට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය ශේෂ පිරික්සුම තුල රු. 716,986 ක් ලෙස දක්වා තිබුණද එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි රු.841,793 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) වියදම් විෂයන් දෙකකට අදාළව ලෙජරයේ ශේෂයන් සහ මූල්‍ය කාර්යය සාධන වාර්තාවේ ශේෂයන් අතර රු.269,136 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2. 3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10 ඉ (I) වගන්තිය | පනත ක්‍රියාත්මක කිරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය (බීඅයිඩීටීඅයි) ලක්ෂ්මන් කදිරගාමර් ආයතනය වෙත පැවරිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත | නිලධාරීන් දෙදෙනකුගේ සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා එකතුව රු.43,368 ක් සේවක |

| | | |
|---|---|---|
| | | අර්ථ සාධක දායක මුදල් නිසි පරිදි අඩු කරගෙන ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඈ) | 1980 අංක 46 සේවක භාරකාර අරමුදල් පනත | නියමිත දිනට දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් එකතුව රු. 9,796 ක අධිභාර ගෙවා තිබුණි. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | ආයතනයේ නිළධාරීන් 18 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව පාරිතෝෂික වෙන් කිරීම් කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 212(2) | වැටුප් අත්තිකාරම් සියයට 40 ක උපරිමයකට යටත්ව ගෙවිය යුතු යැයි සඳහන් කර තිබියදී ඊට පටහැනිව ආයතනයේ නිලධාරියකුට වැටුප් අත්තිකාරම් ලෙස සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේදී සහ ජූලි මාසයේදී පිළිවෙලින් ආරම්භක වැටුපෙන් සියයට 80 ක් හා සියයට 67 ක් වශයෙන් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මිලදී ගනු ලබන ස්ථාවර වත්කම්, පොදු 287 ආකෘතියේ ස්ථාවර වත්කම් ලේඛනයක සටහන් කළ යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු. 3,559,193 ක වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (උ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 9.3.1 ඡේදය | අනුමත තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,339,517 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,691,957 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,647,560 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වියදම රු.7,649,553 කින් වැඩි වුවද පාඨමාලා ගාස්තු ආදායම රු.7,766,397 කින් හා වෙනත් ආදායම් රු. 3,501,700 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශයේ මානව හිමිකම් අංශය සඳහා මාසිකව දීමනා ගෙවීමේ පදනම මත තාවකාලිකව බඳවාගෙන තිබූ නිලධාරීන් 19 දෙනෙකු සඳහා එම නිලධාරීන්ගෙන් ආයතනයට ලැබුණු සේවය තහවුරු කර ගැනීමකින් තොරව පැමිණීම හා පිටවීම මත පදනම්ව සමාලෝචිත වර්ෂයේදී රු.5,783,399 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ බඳවා ගැනීම්, උසස් කිරීම් හා සේවක සංඛ්‍යාව සම්බන්ධ පරිපාටිය සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු.10,000 ක් බාහිර පුද්ගලයෙකුට ගෙවා තිබුණද අනුමත නොවූ තනතුරු සඳහා පමණක් අදාළ පරිපාටි සකස් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 10 ක් ප්‍රමාදවී 2016 ජනවාරි මස 08 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:2 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබූ බැවින් පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් කාර්යසාධනය සමඟ සැසඳීම් කිරීමේ හැකියාවක් නොතිබුණි.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර , අමාත්‍යාංශය විසින් ද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තියේ සඳහන් පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ආයතනවල ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම හා පාලන කාරකයක් ලෙස යොදාගැනීම සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

### 5.6 වාර්ෂික වාර්තා ප්‍රසිද්ධ කිරීම

2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වැටුප් පාලන ගිණුම් නඩත්තු කිරීම
(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වා ගැනීම
(ඇ) මානව සම්පත් කළමණාකරනය